www.plusinfo.lk

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2025-12-10 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

**රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම පිණිස පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කරමින් අවශ්‍යතා, ප්‍රමුඛතා හා කාලරාමු හඳුනාගෙන ඒ ආශ්‍රිතව අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු බඳවාගැනීම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් නිලධාරි කමිටුවක් පත් කරනු ලැබ ඇත. ඒ ඒ අමාත්‍යාංශ විසින් එම අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතනවල පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා එම කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති ඉල්ලීම් සැලකිල්ලට ගෙන, 2025-11-14 දින පැවති එම නිලධාරි කමිටු රැස්වීමේදී සිදු කරනු ලැබ ඇති නිර්දේශ පරිදි පහත සඳහන් බඳවාගැනීම් සිදු කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී: www.plusinfo.lk

| අනු අංකය | අමාත්‍යාංශය/පළාත් සභාව/ කොමිෂන් සභාව | බඳවාගැනීම සඳහා කමිටුව විසින් නිර්දේශ කරන ලද තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | 196 |
| 2. | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | 480 |
| 3 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 04 |
| 4 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 19 |
| 5 | ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 778 |
| 6 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | 222 |
| 7 | වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය www.plusinfo.lk | 107 |
| 8 | ආරක්ෂක අමාත්‍යාංශය | 73 |
| 9 | ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය | 20 |
| 10 | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 21 |
| 11 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 36 |
| 12 | බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 04 |
| 13 | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | 02 |
| 14 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය | 74 |
| 15 | බස්නාහිර පළාත් සභාව www.plusinfo.lk | 230 |
| 16 | ඌව පළාත් සභාව | 08 |
| 17 | වයඹ පළාත් සභාව | 08 |
| 18 | මුදල් කොමිෂන් සභාව | 02 |
| | මුළු සංඛ්‍යාව | 2,284 |